# රක්ෂණ ඔප්පුහිමියෙකු වශයෙන්

## ඔබගේ අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ

## දැනුවත්වන්න



# ඔබේ යුතුකම්...



### සද්භාවයෙන් යුතුව කටයුතු කිරීමට

- රක්ෂණ ඔප්පුව ලබාගැනීමට පෙර මෙන්ම ඉන් පසුවත් සද්භාවයෙන් යුතුව කටයුතු කිරීමට ඔබට යුතුකමක් ඇත.
- රක්ෂණ යෝජනා පත්‍රය පිරවීමේදී ඔබ අවංක විය යුතු අතර ඒ මගින් සත්‍ය හා නිවැරදි තොරතුරු ඔබගේ රක්ෂණ සමාගම වෙත ලබා දිය යුතු ය.
- රක්ෂණ ඔප්පුව යටතේ හිමිකමක් ඉල්ලුම් කිරීමේදීද ඔබ අවංකව, සත්‍ය තොරතුරු සැපයිය යුතුය.
- සත්‍ය හා නිවැරදි තොරතුරු ලබා දීමට ඔබ අපොහොසත් වුවහොත් (විශේෂයෙන්ම ජීවිත රක්ෂණයක් ලබා ගැනීමේදී ඔබේ සෞඛ්‍ය තත්වය සම්බන්ධයෙන්), එය ඔබේ හිමිකම් ප්‍රතික්ෂේපවීමට පමණක් නොව රක්ෂණ ඔප්පුව අවලංගු වී ඒ සඳහා ගෙවූ සියළු මුදල් අහිමි වීමටද හේතු විය හැක.

### රක්ෂණ ඔප්පුව පවත්වා ගෙනයාමට

- රක්ෂණ වාරික ගෙවීමේදී, රක්ෂණ සමාගමෙන් දැනුම් දීමක් ලැබෙන තෙක් නොසිට අදාල දිනට හෝ සහන කාලසීමාව තුළදී රක්ෂණ වාරිකය ගෙවීමත්, එසේ ගෙවන ලද වාරිකය රක්ෂණ සමාගමට ලැබුණු බවට වග බලා ගැනීමත් ඔබේ යුතුකමකි.
- රක්ෂණ වාරික නොගෙවීම හෝ ගෙවීම් ප්‍රමාදවීම හේතුවෙන් රක්ෂණ ඔප්පුව අප්‍රාණික වන අතර ඉන් අනතුරුව රක්ෂණ ඔප්පුව පවත්වාගෙනයාම හෝ ඒ යටතේ ප්‍රතිලාභ ගෙවීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය රක්ෂණ සමාගම වෙත ලැබේ.
- ඔබේ ලිපිනයේ හා දුරකථන අංකයේ යම් වෙනසක් සිදු වුවහොත් ඒ පිළිබඳව නොපමාව රක්ෂණ සමාගම වෙත දැනුම්දීම මගින් රක්ෂණ සමාගම වෙතින් නිකුත් කෙරෙන වැදගත් නිවේදන සියල්ල නොකඩවා ලබාගැනීමට හැකි වේ.

### රක්ෂණ ඔප්පුව කියවා තේරුම් ගැනීමට

- ඔබේ රක්ෂණ ඔප්පුව ඔබ අතට ලැබුණු විගස කියවා බලා එය ඔබ බලාපොරොත්තු වූ රක්ෂණ ආවරණය ද (ආවරණය කර ඇති උපද්‍රව, ප්‍රතිලාභ, ගෙවිය යුතු වාරිකය, ඔප්පු කාලසීමාව හා ඔප්පුවේ කොන්දේසි යනාදිය) යන්න තහවුරු කරගැනීම ඔබේ යුතුකමකි.
- ඔබ ලබාගත් රක්ෂණ ඔප්පුව පිළිබඳව ප්‍රශ්ණ තිබේ නම් නොපමාව රක්ෂණ සමාගම අමතා අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාගත යුතුය.

### හිමිකම් ඉල්ලීමකදී සහයෝගය දැක්වීමට

- රක්ෂණ සමාගමකින් වන්දි ඉල්ලීමේදී, අදාල රක්ෂණාවරණයේ කොන්දේසි අනුව, නිශ්චිත කාලසීමාවක් තුළදී රක්ෂණ සමාගමට දැනුම් දීමටත්, ඒ පිළිබඳ අවශ්‍ය ලියකියවිලි හා වෙනත් අදාල තොරතුරු ලබාදීමටත් ඔබට යුතුකමක් ඇත.
- වන්දි ඉල්ලීමක් සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කිරීම සඳහා රක්ෂණ සමාගමට ඔබේ සහයෝගය අත්‍යවශ්‍ය වේ.
- වන්දි/හිමිකම් නිරාකරණය කිරීම සඳහා සහයෝගය දැක්වීමට, නිශ්චිත කාලසීමාව තුළ දී හිමිකම සම්බන්ධයෙන් රක්ෂණ සමාගමට දැනුම් දීමට හෝ ඒ සඳහා අත්‍යවශ්‍ය ලියකියවිලි හා අදාල තොරතුරු ලබාදීමට ඔබ අපොහොසත් වුවහොත්, ඔබේ රක්ෂණ හිමිකම ගෙවීම ප්‍රමාදවීම හෝ එය ප්‍රතික්ෂේප වීමද සිදු විය හැක.

# ඔබේ අයිතිවාසිකම්...



### තොරතුරු දැනගැනීමට

- රක්ෂණ ඔප්පුවක් ලබාගැනීමට පෙර මෙන්ම ඉන් පසුවත්, ඔප්පුවට අදාල වැදගත් කරුණු සියල්ල පිළිබඳව රක්ෂණ සමාගම විසින් ඔබව දැනුවත් කළ යුතුය.
- රක්ෂණ ඔප්පුව සම්බන්ධයෙන් අපැහැදිලි හෝ තේරුම් ගැනීමට අපහසු ඕනෑම කරුණක් පිළිබඳව, රක්ෂණ සමාගමෙන් අවශ්‍ය පැහැදිලි කරගැනීම් ලබාගැනීමට ඔබට අයිතියක් ඇත.
- ඔබ රක්ෂණ හිමිකම් ඉල්ලීමක් කළ විටදී එහි වත්මන් තත්වය මෙන්ම හිමිකම් ප්‍රතික්ෂේප වීමකදී ඒ සඳහා පදනම් වූ හේතු ද ඇතුළුව, ඔප්පුවට අදාල සියළු කාරණා සම්බන්ධයෙන් පැහැදිලිව ඔබ වෙත දැනුම් දීම රක්ෂණ සමාගමේ වගකීමකි.

### ගෙවන මුදලට සරිලන රක්ෂණාවරණයක් ලැබීමට

- ඔබගේ අවශ්‍යතාවයන්ට වඩාම හොඳින් ගැලපෙන රක්ෂණාවරණයක් ලබාගැනීමට ඔබට අයිතියක් ඇත.
- රක්ෂණ ඔප්පුවේ ප්‍රතිලාභ හෝ එහි සඳහන් කොන්දේසි සම්බන්ධයෙන් ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, රක්ෂණ ඔප්පුවේ සඳහන් නිශ්චිත කාලසීමාව තුළදී, එය අවලංගු කිරීමට ඔබට අයිතියක් ඇත.
- ඔබ ලබාගැනීමට අදහස් කරන රක්ෂණ ඔප්පුව පිළිබඳ අවබෝධ කර ගැනීම සඳහා, රක්ෂණ යෝජනා පත්‍රය භාරදීමට පෙර ආදර්ශ රක්ෂණ ඔප්පුවක් ඉල්ලා කියවා බැලීමට ඔබට අයිතියක් ඇත.

### සද්භාවයෙන් යුතුව සැලකුම් ලැබීම

- සෑම අවස්ථාවකදීම රක්ෂණ සමාගම වෙතින් උපරිම සද්භාවයෙන් යුතුව සැලකුම් ලැබීමට ඔබට අයිතියක් ඇත.
- රක්ෂණ ඔප්පුවක් අලෙවි කිරීමේදී හෝ ඊට අදාල සේවා සැපයීමේදී රක්ෂණ සමාගම විසින් ඔබව නොමඟ යවන සුළු අයුරින් කටයුතු නොකළ යුතුය.
- රක්ෂණ ඔප්පුව ආශ්‍රිත සියළු කටයුතු වලදී රක්ෂණ සමාගම විසින් සත්‍ය, සාධාරණ හා විනිවිද පෙනෙන සුළු අයුරින් ක්‍රියා කළ යුතුය.

### පැමිණිලි නිරාකරණය කර ගැනීමට

- ඔබේ රක්ෂණ ඔප්පුවට අදාල ඕනෑම කරුණක් සම්බන්ධයෙන් (රක්ෂණ හිමිකමක් සම්බන්ධයෙන් සමාගම කටයුතු කළ ආකාරය සහ ගෙවන ලද වන්දි ප්‍රමාණය ද ඇතුළුව) රක්ෂණ සමාගම වෙත පැමිණිලි කිරීමට ඔබට අයිතියක් ඇත.
- ඔබගේ පැමිණිල්ල සම්බන්ධයෙන් සාධාරණව, කාර්යක්ෂමව සහ අප්‍රමාදව කටයුතු කිරීමට රක්ෂණ සමාගමට වගකීමක් ඇත.
- රක්ෂණ සමාගම විසින් ඔබගේ පැමිණිල්ල නිරාකරණය කරන ලද ආකාරය පිළිබඳව ඔබ හට සෑහීමකට පත් විය නොහැකි නම්, ඒ පිළිබඳව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වෙත දැනුම්දීමට ඔබට අයිතියක් ඇත.

**මතක තබා ගන්න :-**

ඔබේ අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්වීමෙන් හා ඔබේ යුතුකම් ඉටු කිරීමෙන්, ඔබට සතුටුදායක රක්ෂණාවරණයක් ද මානසික සහනයක් ද ලබාගත හැකි වනු ඇත.

**වැඩි විස්තර සඳහා අමතන්න :-**


වෙළඳපල සංවර්ධන හා බාහිර සබඳතා ඒකකය

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය**

11 වන මහල, නැගෙනහිර කුළුණ

ලෝක වෙළඳ මධ්‍යස්ථානය

කොළඹ 01.

දුරකථන අංක : 011 2396184-9

ෆැක්ස් : 011 2396190

ඊමේල් : info@ibsl.gov.lk

වෙබ් අඩවිය : www.ibsl.gov.lk


ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යනු, රක්ෂණ ඔප්පුහිමියන්ගේ හා අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ගේ යහපත ආරක්ෂා කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම, අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම සඳහා පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.